

# ‘විශ්ව සාහිත්‍යය’ ලොව පුරා ව්‍යාප්තව ගිය යෙදුම

විශ්ව සාහිත්‍ය පිලිබඳ බොහෝ දෙනෙකුගේ අවධානය දැඩිව යොමුවෙමින් පවතින මෙවන් කාලයක මගේ හිතවත් කිවිදෙක් ගැඹුරු පැනයක් විද්‍යුත් මාධ්‍යයෙන් මා වෙත යොමු කලේය.

“කවිය කියන එක මේ වකවානුවේදී විශ්වීය වශයෙන් කොයි වගේ ඉසව්වකද තියෙන්නේ ?.”

කිසිදු දිනක කිසිවෙකුත් මගෙන් අසාවියැයි නොසිතූ මේ පැනය මගේ දෑස් තුළින් රිංගා ඉහමොළ කිතිකවන්නට වූ බැවින් පොත පත ඇසුරෙන් මා විඳි ඒ ඉමියුරු රස ගුලාව ඉතා වේගයෙන් අකුරු වන්නට විය. නමුත් රෑ බෝ වී තිබුනු හෙයින් මොළේ තිරිංග තදකොට ඒ ලිවීම අසීරුවෙන් නවතාගත්තේ මගේ කවි මිතුරාට ලිපි පෙළක්ම ලියන පොරොන්දුව පිටය. ඒ පොරොන්දුව ඉටුකිරීමට තරම් කාලය මට ඉඩක් සාදා දුන්නේ නැත. එහෙත් අද විශ්ව සාහිත්‍යය තුල මා විඳි අනන්ත ආශ්චර්ය කවුරුන් හෝ සමඟ බෙදාහදා ගන්නට පුංචි වේදිකාවක් තැනී ඇති බව හැඟේ. විශ්ව සාහිත්‍යය තුල කවිය පමණක් නොව, නවකතාව, කෙටිකතාව, නාට්‍යය හා සිනමාවද පියවර මැන ඇති මාවත ගැන සාකච්ඡා කිරීමට පෙර ‘විශ්ව සාහිත්‍යය’ යන යෙදුමෙන් අදහස් කෙරෙන්නේ කුමක්දැයි හඳුනාගැනීම වටිනේයැයි සිතමි.

‘විශ්ව සාහිත්‍යය’ යන්නනෙන් අදහස් කෙරෙන්නේ ‘බටහිර සාහිත්‍යයේ ලෝක පූජිත වීම’ ලෙස පිලිගගැනුන සමයක උතුරු ඇමරිකානුවන් ‘විශ්ව සාහිත්‍යය’ දුටුවේ එය බටහිර සාහිත්‍යයේ නොව යුරෝපා සාහිත්‍යයේ අග්‍ර කෘතිවල එකතුවක් ලෙසයි. නමුත් අද විශ්ව සාහිත්‍යය කෙරෙහි මුළු ලොවෙහිම විශිෂ්ඨ නිර්මාණයන්ගේ දායකත්වය ලැබී ඇත. ඒ පිළිබඳ පුළුල් අවබෝධයක් ලෝක ප්‍රජාව තුළ ඇතිකර ගැනීමට ඇවැසි අවකාශයක් නිර්මාණය වීමද එහිම ප්‍රතිඵලයකි. පෙර නොදුටු විරූ අතිවිශාල නිර්මාණ රාශියක් ඉතා උසස් පරිවර්තන තුලින් කියවා රසවිඳීමටද අද ලොවපුරා පාඨකයින්ට හැකිවී තිබේ.

දහ නවවන සියවසේ මුල් දශක කිහිපය තුල ‘යොහාන් වොල් (ෆ්) ගන් වොන්-ගොත’ (Johann Wolfgang von Goethe) නම් ජර්මන් ජාතික ලේඛකයා, එකල යුරෝපය තුල ජාත්‍යන්තර නිර්මාණ පිළිගැණුනු හා පරිශීලනය කෙරුනු අයුරු පැහැදිලි කිරීමේදී ‘විශ්ව සාහිත්‍යය’ යන යෙදුම ඔහුගේ රචනා කිහිපයකම භාවිතා කොට ඇත. ඔහු හඳුන්වාදුන් ‘විශ්ව සාහිත්‍යය’ තුළ බටහිර නොවූ නිර්මාණ පිලිබඳවද අවධානය යොමු වී තිබුණි. 1835 දී ඔහුගේ ශිෂ්‍යයකු වූ යොහාන් පීටර් ඉකර්මන් ඉදිරිපත් කළ ‘Conversations of Gothe’ (‘ගොතේ සමඟ කතාබස්’) නම් වූ ග්‍රන්ථයෙන් පසු වොල්(ෆ්)ගෙන් වොන්-ගොත විසින් නිර්මිත ‘විශ්ව සාහිත්‍යය’ යන යෙදුම ලොව පුරා ව්‍යාප්තව භාවිතාවන්නට විය.

පර්සියාවේ හා සර්බියාවේ කවි නිර්මාණ සහ චීන නවකතා කියවීමට තමා තුළ පවත්නා උනන්දුව පිළිබඳවත්, ඔහුගේම නිර්මාණ විදේශයන්හිදී, විශේෂයෙන් ප්‍රංශයේදී පරිවර්තනය වනු දැකීමට ඔහු තුළ පැවති සිහිනමය බලාපොරොත්තු පිළිබඳවත් ගොතේ ඉකර්මන් හට පවසා තිබෙන බව එහි දැක්වේ. 1827 ජනවාරියේදී ගොතේ විසින් කළ ජනප්‍රිය අනාවැකියට අනුව ‘ඉදිරි වසර කිහිපය තුල, ‘දේශීය සාහිත්‍යය’ අභිබවමින් ‘විශ්ව සාහිත්‍යය’, නිර්මාණකරණයේ මූලික න්‍යායක් වනු ඇත’ යන්නද




ඉකර්මන්ගේ ‘Conversations of Gothe’ ග්‍රන්ථයේ තවදුරටත් සඳහන් වේ. එම ග්‍රන්ථයේ ඇති ගොතේගේ එක් ප්‍රකාශයක් පහතින් පරිවර්ථනය කර දක්වමි.

“සිය ගණන් මිනිසුන් තුලින්ම මතුවෙමින් හා සනාත වෙමින්ද, යුග ගණන් පවතිමින්ද කවිය මිනිස් වගගේ විශ්වීය උරුමය වන බව මම ඉඳුරා කියමි. එනිසාම විදේශිකයන් තුලින් මාවම දකින්නට මා ඉතා මනාප වන අතර ඔබටත් එසේ කරනට උපදෙස් දෙමි. දේශීය සාහිත්‍ය යන්න අරුත්සුන් වී ‘විශ්ව සාහිත්‍යයමය යුගයක්’ එළඹෙමින් පවතියි. එම එළැඹුම කඩිනම් කිරීමට සියල්ලන්ම වෙහෙසිය යුතුය.....” [‘Conversations of Gothe’ – පිටුව 132)

සාහිත්‍යය විචාරකයෙක් හා දාර්ශනිකයෙක් වන මාර්ටින් පුච්නර්ගේ තර්කයට අනුව නම් ගොතේගේ තියුණු සංවේදීභාවය විසින් සාහිත්‍යයට ඇති ලෝක වෙළඳපොල තත්වයන් හඳුනාගෙන තිබෙන්නට ඇත. එම වෙළඳපොල පදනම් කරගත් ප්‍රවේශයක් තුලින් 1848 මාක්ස් හා එංගල්ස් සිය ‘කමියුනිස්ට් මැනිෆෙස්ටෝ’ ග්‍රන්ථයේ ඉහළ මධ්‍යම පන්තිය පිළිබඳ සර්වභෞමික ලක්ෂණ විස්තර කරන්නට ඇත.

මාක්ස් හා එංගල්ස් ධනේශ්වර ක්‍රමය තුළින් බිහි වූ විශ්ව සාහිත්‍යය සංකල්පය අගය කලද ‘කමියුනිස්ට මැනිෆෙස්ටෝ’ තුලින් එම අදහස අභිබවා ගොස් තිබේ. ඔවුනට ඇවැසි වූයේ නවකාව්‍යයෙන් යුතු විශ්ව සාහිත්‍යයක් බිහි කිරීමටයි. එහෙත් ප්‍රයත්නය පූර්ණ සාර්තකත්වයකට පත් නොවූවද මැනිෆෙස්ටෝ ග්‍රන්ථය විසිවෙනි සියවසේ බිහිවූ බලවත්ම මුල් ග්‍රන්ථ අතුරින් එකක් බවට පත්වී තිබේ.

මාක්ස් හා එංගල්ස් වොල්ෆ්ගෙන් වොන්-ගොත අනුව යමින් විශ්ව සාහිත්‍යය යන්න අධ්‍යතන හා අනාගත ප්‍රපංචයක් ලෙස විවරණය කරන්නට උත්සාහ දැරූ අතර 1886 අයිරිෂ් ජාතික හච්සන් මැකොලේ පොස්නෙට්ගේ (Hutcheson Mecaulay Posnett) අදහස වූයේ විශ්ව සාහිත්‍යයේ ආරම්භය සිදුවුනේ, අද්‍යතන රාජ්‍යය සාහිත්‍යයෙනුත් එපිට, අතීත රෝමානු අධිරාජ්‍යය වැනි පුරාණ අධිරාජ්‍යයන් තුළින් බවයි.

විශ්ව සාහිත්‍යයේ උපත සහ ‘විශ්ව සාහිත්‍යය’ යන යෙදුම භාවිතයේ උපත පිළබඳ කෙබඳු මතවාද පැවතියද පිලිගත හැකි එක් මහඟු සත්‍යයක් ඇත. එනම්, මේ වනවිට එකම විශ්වීය ප්‍රේක්ෂකාගාරයක් තුල රස විඳිය හැකි ලොව විවිධ කාල වකවානුවලදී නිමැවුන සම්භාවනීය මෙන්ම අධ්‍යතන කලා නිර්මාණ රාශියක් ‘විශ්ව සාහිත්‍යය’ තුලින් නිසැකවම අවබෝධ කරගත හැකි බයයි. විසිවන සියවසේ ඇරඹුමත් සමඟම ලොව පුරා වෙසෙන බුද්ධිමතුන් තම තමන්ගේ නිර්මාණ විශ්ව සාහිත්‍යමය ආකෘතීන්ගේ අභා ෂයෙන් ඉදිරිපත් කරීමට උත්සාහ දරමින් සිටින බවයි.





සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර
www.thisara.com